# ශ්‍රී ලාංකේය ජනගහනය සඳහා කපාල දර්ශකය නිර්ණය කිරීම

**ජී. යූ. මහකුමාරගේ[1], එස්. ආර්. හුලත්දූව[2] සහ සී. ඒ. ඩී. නාහල්ලගේ[3]**
**[13]සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය; [2]වෛද්‍ය විද්‍යා පීඨය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***sanjayarh@yahoo.co.uk***

එකිනෙකට වෙනස්වන මිනිසාගේ හිසේ හැඩයෙහි ප්‍රමාණාත්මක වෙනස අධ්‍යයනය කිරීම සඳහා කපාල දර්ශකය යොදා ගනී. ප්‍රධාන වශයෙන් කපාල දර්ශකයන් අතර මිනුම්වලට ලක්වන්නේ හිසේ දිග හිසේ පළල ය. කපාලය මැනීම සඳහා භාවිත කරන්නේ විහිදුනු කැලිපරය**යි.** හිසෙහි දිග මැනීම සඳහා ඇහිබැම අතර පිහිටි **ග්ලැබෙල්ලා** (Glabella) සිට හිසෙහි අපර කපාලයේ නෙරුම වන ඔපිස්තොක්‍රේනියම (Opisthocranion) දක්වා ඇති උපරිම දුර ප්‍රමාණය සලකා බලයි. හිසෙහි පළල, හිසේ උපරිම උස ස්ථානයන්හි පාර්ශව කපාල අතර දුර ලෙස මැන දක්වන ලදී. ප්‍රධාන අරමුණ ලෙස පශ්චාත් මරණ පරීක්ෂණවලට ලක්කරන වැඩුණු පුද්ගලයන්ගේ කපාල දර්ශකයන් තුළින් පුද්ගල විවිධත්වය නිර්ණය කිරිමය. උප අරමුණු වන්නේ පශ්චාත් මරණ පරීක්ෂණවලට ලක්කරන පුද්ගලයන්ගේ කපාල දර්ශකය හා උස අතර සම්බන්ධය නිර්ණය කිරිම, මෙම පුද්ගලයන්ගේ වර්ගය හා ජාතිය නිර්ණය කිරිම හා හිසෙහි සම සහිතව හා සම රහිතව මිනුම් ලබා ගැනීම තුළින් පුද්ගල විවිධත්වය නිර්ණය කිරීමය.

කළුබෝවිල ශික්ෂණ රෝහලේ පශ්චාත් මරණ පර්යේෂණ දේහයන් 30ක් නියැදිය ලෙස ලබා ගත්තෙමු. මූලික වශයෙන් හිසෙහි සම සහිතව හා සම රහිතව මිනුම් ලබා ගැනිණ. අවුරුදු 14ක අවම වයස් කාණ්ඩයත් අවුරුදු 87ක වැඩිම වයස් කාණ්ඩයක් විය.ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ගත්විට 16.61% ස්ත්‍රී වූ අතර පුරුෂ ප්‍රතිශතය 83.34% ක් විය.කපාල මිතිය හා කපාල දර්ශකය වෙන වෙනම මෙතෙක් සොයා බැලූ අතර මෙහිදී මේ ද්විත්වය එකට ගෙන සොයා බැලීම සිදු කෙරේ. කපාල මිතික හා කපාල දර්ශක අගයන් 30ක් ඇසුරින් මේවා වගු ගත කොට හැක. කපාල මිතිය හා කපාල දර්ශක අතර උපරිම අගයන් *(Manimum)* 87.73ක් හා 93.7 ද අවම අගයන් *(Minimum)* 69.14ක් හා 70.41 ද සාමාන්‍ය *(Average)* 79.18ක් හා 81.63 ද සම්මත අපගමනය *(SD)* 7.72ක් හා 5.47 ලෙස ද පෙන්වා **දි**ය හැක. කපාල මිතියෙහි වැඩිම හා අවම අගයන් ලෙස 93.7cm හා 70.4cm ලෙස ද කපාල දර්ශකයේ උපරිම අගය හා අවම අගය 87.43cm හා 69.14cm ලෙස ද දැක්විය හැක.

කපාල මිතිය 79.78± 4.72 ද කපාල දර්ශකය 81.63± 5.47 ලෙස ද පෙන්විය හැකිය. ස්ත්‍රීන්ගේ කපාල මිතිය 81.64± 4.04 වන අතර පිරිමින්ගේ 81.63± 5.78 හා කපාල දර්ශකය 79.92± 4.66 පිරිමින්ගේ වන අතර ස්ත්‍රීන්ගේ 79.01± 5.47 වේ. ශ්‍රී ලාංකික බොහෝ කාන්තාවන් මධ්‍යශීර්ෂය *(Mesocephalic)* ගණයට අයත් වන බවත් පිරිමින් බොහෝදෙනෙක් *Brechycephalic* ගණයට අයත් බවත් පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කපාලමිතිය, කපාලදර්ශකය, විහිදුනු කැලිපරය, ඔපිස්තොක්‍රේනියම,* ***ග්ලැ****බෙල්ලා*